(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 135.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 මාර්තු 04 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1269/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ පාසල්වල අර්ධ වශයෙන් ඉදිකිරීම් කටයුතු සිදු කර අතහැර දමා තිබෙන ගොඩනැගිලි පවතින බව දන්නේද;

(ii) එම ගොඩනැගිලි සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමට බලපා ඇති ප්‍රධාන හේතු කවරේද;

(iv) ඉහත ගොඩනැගිලි අතරින් 2025 වර්ෂයට අදාළ අයවැය මඟින් වැඩ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ගොඩනැගිලි සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගොඩනැගිලිවල වැඩ අවසන් කරනු ලබන කාල වකවානුව කවරේද;

(vi) අර්ධ වශයෙන් ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති ගොඩනැගිලි හේතුවෙන් පාසල් සිසුන්ට හා පාසල් කාර්ය මණ්ඩලයට අනතුරක් සිදු නොවීමට ගෙන ඇති පූර්ව ආරක්ෂක විධිවිධාන කවරේද;

(vii) ඉහත ගොඩනැගිලි කඩිනමින් හා ආරක්ෂාකාරීව සාදා නිම කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1335/2025

ගරු සුරංග රත්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අලෙවි මණ්ඩලය සතු ගබඩා, වී ගබඩා කළ හැකි තත්ත්වයේ පවතින්නේද;

(ii) එසේ නම්, එම එක් එක් වී ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) 2025 වර්ෂයේ යල කන්නයේ අපේක්ෂා කරනු ලැබූ වී අස්වැන්න කොපමණද;

(iv) එම අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගැනීමට අපේක්ෂා කරන වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(v) එම වී ප්‍රමාණය, ඉහත සඳහන් යල කන්නයේ අපේක්ෂිත වී අස්වැන්නේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) 2025/2026 මහ කන්නයේදී වී අස්වැන්න ඉහළ නැංවීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1406/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කර ඇති වාරි වැව් සංඛ්‍යාව;

(ii) එම වැව් යටතේ තිබෙන සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය;

(iii) එම වැව් අතුරින් මේ වනවිට භෝග වගාව සඳහා ජලය සපයනු ලබන වාරි වැව් සංඛ්‍යාව;

(iv) එමගින් පෝෂණය වන කුඹුරු ඉඩම් ප්‍රමාණය;

(v) මේ වනවිට භාවිතයට නොගෙන අතහැර දැමූ වැව් සංඛ්‍යාව;

(vi) එම වැව් යටතේ ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අත්හැර දමා ඇති වාරි වැව් ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට කිසියම් සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත එම වාරි වැව් යටතේ පවතින කුඹුරු ඉඩම් වගා කටයුතු සඳහා කුඹුරු ඉඩම් නොමැති පුද්ගලයන්ට බෙදා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1468/2025

ගරු චානක මාදුගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2025 වර්ෂයට අදාළ අයවැය යටතේ විශේෂිත ක්‍රීඩා පාසල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දකුණු පළාත තෝරා නොගැනීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂයට අදාළ අයවැය මඟින් වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) 2025 අගෝස්තු මාසය වනවිට ඉහත මුදලෙන් වියදම් කර ඇති මුදල කොපමණද;

(iv) විශේෂිත ක්‍රීඩා පාසල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පළාත් පහක් පමණක් තෝරා ගැනීමේ පදනම කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1476/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපාදන යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතින ව්‍යාපෘති සහ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ත්‍රිකුණාමලය මැක්හෙයිසර් ක්‍රීඩාංගනය (Mc Heyzer Stadium) සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

(iv) 2026 අයවැය ප්‍රතිපාදන යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*6.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

7.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.